# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 32 දරන ෆවුස් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 අගෝසතු  මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 අගෝස්තු මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ
II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 6.00  යි.    තැපැල් ගාස්තුව :  රු. 5.00 යි

## 2007 අංක 32 දරන ෆවුස් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 අගෝස්තු මස 10 වන දින]

එල්. ඩී.—ඕ. – අයි. එන්. සී. 8/2005

### ෆවුස් භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ෆවුස් භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන භාරයක්, එකී භාරයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා මෙතෙක් කල් ඇති කර තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී භාරය ඇති කරන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී භාරයේ භාරකරුවන් විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී භාරය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 32 දරන ෆවුස් භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ෆවුස් භාරය " දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ භාරකාර මණ්ඩලය මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු ෆවුස් භාරය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් වන අතර, ඒ නාමයෙන් සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. ෆවුස් භාරය සංස්ථාගත කිරීම.

**3**. භාරය ඇති කරන ලද්දේ යම් පොදු පරමාර්ථ උදෙසා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) මුස්ලිම් සිසුන්ගේ අධ්‍යාපනික තත්ත්වය වඩාත් සතුටුදායක තත්ත්වයකට පත් කිරීම හා දකුණු පළාතේ පිහිටි සම්පත් හීන දෙමළ මාධ්‍ය පාසල් වැඩි දියුණු කිරීම ;

(ආ) සිංහල මාධ්‍යයෙන් ඉගෙනුම ලබන මුස්ලිම් සිසුනට සිංහල මාධ්‍යයෙන් අවශ්‍ය පොත්පත් ලබා දීම ;

(ඇ) දකුණු පළාතේ රැකියා විරහිත මුස්ලිම් තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ඇති කිරීම හා ඔවුන් ස්වයං රැකියාවලට යොමු කිරීම සහ ඒ සඳහා මූල්‍යමය ආධාර සැපයීම ;

(ඈ) දෑවැදි ක්‍රමය අහෝසි කිරීම සඳහා මුස්ලිම් ප්‍රජාව දැනුවත් කිරීම ;

(ඉ) උසස් අධ්‍යාපනය ලැබීම සඳහා මුස්ලිම් තරුණ තරුණියන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ මූල්‍යමය ආධාර සැපයීම ;

(ඊ) ස්වකීය නිකාහ් උත්සවය සඳහා දුප්පත් මුස්ලිම් කාන්තාවන්ට මුදලින් ආධාර දීම ; සහ

(උ) නිවාස නොමැති මුස්ලිම් ජනතාව සඳහා නිවාස යෝජනා ක්‍රමයන් හඳුන්වා දීම.

සංස්ථාවේ බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙන් පහ කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය කිරීම ;

(ආ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යම් තැනැත්තකුගෙන් හෝ සංස්ථාගත වූ හෝ නො එසේ වූ පුද්ගල මණ්ඩලයකින්, මුදලින් හෝ ද්‍රව්‍යවලින් වූ යම් ආධාරයක්, ප්‍රදානයක් හෝ ත්‍යාගයක් ලබා ගැනීම හෝ එකතු කිරීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ කිසිවක් හෝ සියල්ල හෝ වැඩිදුරටත් ඉටු කර ගැනීමේ කාර්යය සඳහා විදේශීය රටවල සංස්ථාවේ ශාඛා සංවිධාන පිහිටුවීම ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ වැඩිදුරටත් කරගෙන යාම සඳහා අවශ්‍ය මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම සහ එසේ ණයට ගන්නා ලද හෝ ලබා ගන්නා ලද ඒ මුදල් ගෙවීම සුරක්ෂිත කිරීම සඳහා උකස්කර හෝ බැඳුම්කර ලියා අත්සන් කිරීම ; සහ

(ඉ) සංස්ථාවේ පරමාර්ථ සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙලින්ම හෝ සංස්ථාව විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ එහි නිලධරයන්, සේවකයන් හෝ නියෝජිතයන් මගින් එළඹීම හෝ එම ගිවිසුම් හෝ එකඟවීම් ඉටු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු සභාපතිවරයා සහ තෝරා පත් කර ගන්නා ලද සාමාජිකයන් සංඛ්‍යාවක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි කුමක් සඳහන් වුව ද, භාරයේ ආරම්භක සභාපති වූ එම්. එල්. ෆවුස් මහතා සංස්ථාවේ ප්‍රථම භාරකාර සභාපති විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**6**. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, අන්තිම කැමති පත්‍ර නියාදනයකින් හෝ අන් ලෙසකින් කවර වුව ද චංචල සහ නිශ්චල දේපළක් අත් කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් හැකියාව හා ශක්‍යතාව තිබිය යුතු අතර, එබඳු යම් දේපළ සංස්ථාවේ රීතිවලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන් ලෙසකින් බැහැර කිරීමේ පූර්ණ බලතල සහිතව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව විසින් ඒවා දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**7**. (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ධුර කාලය සහ ඔවුන්ගේ බලතල සහ කාර්ය ;

(ඇ) සංස්ථාවේ රැස්වීම්වල දී එහි වැඩකටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඈ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම; සහ

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන්, සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. සංස්ථාවේ අරමුදල—

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුවම වූ දිනයේ දී භාරයේ බැරට තිබුණු සියලු මුදල් වලින් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු සංස්ථාවට එකතු වන සියලු මුදල් වලින්,

සමන්විත විය යුතු ය.

විගණනය සහ ගිණුම්.

9. (1) සංස්ථාවේ සියලු වත්කම් සහ බැරකම්, ආදායම් හා වියදම් හා වෙනත් ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තැබීමට සංස්ථාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සංස්ථාව විසින් පත් කරනු ලබන, සුදුසුකම් ලත් විගණකවරයන් විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

භාරය විසින් ගෙවිය යුතු සහ භාරයට අයවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති භාරයේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට භාරයට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල්, ආධාර මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**11**. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ සභාපතිගේ භාරයෙහි තිබිය යුතු අතර, එය ඒ භාරකාර සභාපති සහ සංස්ථාවේ රීති වලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**12**. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව, යම් දේපළක් හෝ යම් ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන, සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කළ යුතු ය. විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**13**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.